සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024**
**Third Term Test - Grade 13 - 2024**

විභාග අංකය: ......................................

# ව්‍යාපාර අධ්‍යයනය - I

**කාලය පැය 02 යි**

<u>උපදෙස්:-</u>

- අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමි වේ.
- විභාග අංකය ඉහළින් ඇති තිත් ඉර මත පැහැදිලි ව සටහන් කරන්න.

| ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

(01) වර්තමානයේ ව්‍යාපාර දත්ත විශ්ලේෂණයන් ස්වයංක්‍රීය හා ශක්තිමත් කරමින්, වඩාත් නිවැරදි පුරෝකථනයන් සිදුකරමින් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහය සපයන හා මිනිස් ක්‍රියාකාරීත්වයේ ව්‍යාපාරයක් තුළ වඩාත් කාර්යක්ෂම කරන්නා වූ තාක්ෂණික ක්‍රියාවලියකි.

(1) CAD ක්‍රමවේදය (2) SWOT විශ්ලේෂණය
(3) Whatsapp තාක්ෂණය (4) AI තාක්ෂණය
(5) WAN ක්‍රමවේදය (......)

(02) සිල්ලර වෙළඳාම, තොග වෙළඳාම, ආනයන වෙළඳාම, අපනයන වෙළඳාම හා උපකාරක සේවා ද එකතු වූ විට,

(1) ව්‍යාපාර නිර්මාණය වේ. (2) සේවා නිර්මාණයවේ. (3) වානිජ්‍ය නිර්මාණයවේ.
(4) විදේශ වෙළඳාම නිර්මාණයවේ (5) කර්මාන්ත නිර්මාණය වේ. (......)

(03) පහත සඳහන් ඒවායින් කාර්මික අංශයේ ලාභ අරමුණුකරගත් පොදු හිමිකාරිත්වයක් යටතේ පවතින මහා පරිමාණ ව්‍යාපාරයක් වන්නේ,

(1) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය (2) ලංකා පොස්පේට් සමාගම
(3) මාස් හෝල්ඩින්ග්ස් සමාගම (4) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
(5) ඇක්සස් ඉංජිනියරින් සමාගම (......)

(04) දළ ජාතික ආදායම හා ආර්ථික පරිවර්ථන පනත පිළිවෙලින් අයත්වන පරිසරයක් වන්නේ,

(1) ආර්ථික පරිසරය හා දේශපාලන පරිසරය (2) ප්‍රජා පරිසරය හා දේශපාලන පරිසරය
(3) ප්‍රජා පරිසරය හා නෛතික පරිසරය (4) ආර්ථික පරිසරය හා ආර්ථික පරිසරය
(5) ආර්ථික පරිසරය හා නෛතික පරිසරය (......)

(05) ව්‍යාපාරයකින් සමාජයට ඉටුවිය යුතු සමාජ වගකීමක් නොවන්නේ,

(1) බදු ගෙවීම නොපිරිහෙලා ඉටු කිරීම (2) අපද්‍රව්‍ය කළමනාකරණය
(3) සාධාරණ ඉපයීමක් ලබාදීම (4) රැකියා නියුක්තියට දායක වීම
(5) හරිත නිෂ්පාදන බිහි කිරීම (......)

(06) රජය විවෘත වෙළඳපල තුළ සුරැකුම්පත් අලෙවි කිරීමෙන් අපේක්ෂා කරනුයේ,

(1) ආර්ථිකයේ මුදල් සැපයුම ප්‍රසාරණය කිරීම
(2) සේවා නියුක්තිය ඉහළ දැමීම
(3) පොලී අනුපාතික පහළ දැමීම
(4) ආර්ථිකයේ මුදල් සැපයුම සංකෝචනය කිරීම හරහා උද්ධමන පාලනය
(5) ආර්ථිකයේ මුදල් සැපයුම නොවෙනස්ව ස්ථාවර මට්ටමක පවත්වාගෙන යාම (......)

(07) ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනයේ ප්‍රමිත ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන ආකාරයක් නොවන්නේ,

(1) ප්‍රමිත පිළියෙල කිරීම මගින් (2) ආනයන පරීක්ෂාව මගින්
(3) පූර්ව අපනයන පරීක්ෂාව මගින් (4) ස්වෙච්ඡාවෙන්
(5) SLS සහතික ලාංඡන ක්‍රමය මගින් (......)

(08) අන්තර් ජාතික සහයෝගිතාව සඳහා වූ ජපාන බැංකුවේ (JBIC) මූල්‍ය අනුග්‍රහකත්වයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ණය යෝජනා ක්‍රමය වන්නේ,

(1) සුවන (2) සුමේධ (3) ලිය ඉසුර
(4) සහන්යා (5) සිඩ්ස් (......)

(09) සීමාසහිත පොදු සමාගමක් හා සසඳන කළ සීමා සහිත පෞද්ගලික සමාගමක පවතින හිතකර ලක්ෂණයක් වන්නේ,

(1) කොටස් හා ණයකර ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකි වීම
(2) අධ්‍යක්ෂකවරුන් සීමාවකින් තොරව පත් කර ගත හැකි වීම
(3) පැවැත්ම අඛණ්ඩ වීම
(4) නෛතික පුද්ගලභාවයක් පැවතීම
(5) ව්‍යාපාරයේ පාලන බලය සීමිත පිරිසක් අතර රඳවා ගත හැකි වීම (......)

(10) පහත වගුවේ A තීරුවෙහි මූල්‍ය ආයතන ද, B තීරුවෙහි එම මූල්‍ය ආයතනවලට සුවිශේෂී වූ කාර්යයන් ද දැක්වේ.

| A | B |
|---|---|
| 1. බලපත්‍රලාභී වාණිජ බැංකු | අ) කුලීපිට ගැනුම් පහසුකම් සැපයීම |
| 2. වණික් බැංකු | ආ) ඉල්ලුම් තැන්පතු ගිණුම් පවත්වාගෙන යාම |
| 3. ව්‍යවසායකත්ව ප්‍රාග්ධන සමාගම්. | ඉ) ව්‍යාපෘති වාර්තා සැකසීම |
| 4. මූල්‍ය සමාගම් | ඊ) නව ව්‍යවසායකයින්ට ප්‍රාග්ධනය සැපයීම |

ඉහත A හා B තීරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

(1) 1 - ආ, 2 - ඉ, 3 - ඊ, 4 - අ (2) 1- ඊ, 2- ආ, 3- අ, 4- ඉ (3) 1- ඉ, 2- ඊ, 3- අ, 4- ආ
(4) 1- ආ, 2- අ, 3- ඊ, 4- ඉ (5) 1- ඊ, 2- ඉ, 3- ආ, 4- ආ (......)

(11) ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ බැංකුව ලෙස කටයුතු කිරීමේ දී ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු හා ඉටුකරනු ලබන කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

A - ව්‍යවහාර මුදල් නිකුත් කිරීම
B - මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවීම
C - මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව ඇති කිරීම (......)
D - ආර්ථික හා මිල ස්ථායීතාව ඇති කිරීම
E - විනිමය අනුපාත ප්‍රතිපත්තිය කළමනාකරණය කිරීම

ඉහත සඳහන් දෑ අතරින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු ද්විත්වය වන්නේ,

(1) A හා E ය (2) B හා C ය (3) C හා D ය
(4) A හා D ය (5) C හා E ය (......)

(12) ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ කටයුතු කරන බලපත්‍රලාභී විශේෂිත බැංකු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ලංකා බැංකුව, මහජන බැංකුව, ඉතිරි කිරීමේ බැංකුව
(2) මහජන බැංකුව, ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව, ලංකා බැංකුව
(3) ලංකා බැංකුව, මහජන බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
(4) ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, මහජන බැංකුව
(5) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව (......)

(13) සමුද්‍රිය රක්ෂණයෙන් මුහුදු මාර්ග ප්‍රවාහනයේ දී සිදුවන හානි ආවරණය කර ගැනීමට හැකියාව ලැබේ. මෙම සමුද්‍රිය රක්ෂණයේ දී නැව් කඳ රක්ෂණය යටතේ ලබාගත හැකි රක්ෂණ ඔප්පු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) නැව් බඩු රක්ෂණ ඔප්පුව, තැනීම් හානි ඔප්පුව, තොටුපල ඔප්පුව, අලුත් වැඩියා ඔප්පුව
(2) ගැටීම් හානි ඔප්පුව, නැව් බඩු රක්ෂණ ඔප්පුව, සියලු අවදානම් ඔප්පුව, තැනීම් හානි ඔප්පුව
(3) චල ඔප්පුව, ගැටීම් හානි ඔප්පුව, සියලු අවදානම් ඔප්පුව, අලුත් වැඩියා ඔප්පුව
(4) පූර්ණ අලාභ පමණක් ගෙවන ඔප්පුව, සියලු අවදානම් ඔප්පුව, තැනීම් හානි ඔප්පුව, අලුත් වැඩියා ඔප්පුව
(5) චල ඔප්පුව, පූර්ණ අලාභ පමණක් ගෙවන ඔප්පුව, තොටුපල ඔප්පුව, අලුත් වැඩියා ඔප්පුව (......)

(14) පහත දැක්වෙන වරණයන් තුළ වෙළඳාම බිහිවීමට බලපෑ සාධක හා වෙළඳාමේ සංවර්ධනයට බලපෑ සාධක අන්තර්ගත වේ. ඒ අතරින් වෙළඳාමේ සංවර්ධනයට හේතු වූ සාධකය කුමක් ද?

(1) අතිරික්ත නිෂ්පාදනය
(2) කාර්මික විප්ලවය
(3) වක්‍ර නිෂ්පාදනය
(4) වුවමනා තනිව සපුරාගත නොහැකි වීම
(5) විශේෂීකරණය (......)

(15) ශ්‍රී ලංකාව මුහුණ දී සිටින ආර්ථික අර්බුදයෙන් මිදීම සඳහා විස්තීර්ණ ණය පහසුකමක් ලබා දෙමින්, ආර්ථික ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කළ ආයතනය වන්නේ,

(1) ලෝක බැංකුව (2) අන්තර්ජාතික මූල්‍ය අරමුදල
(3) ලෝක වෙළඳ සංවිධානය (4) ආසියානු සංවර්ධන බැංකුව
(5) යුරෝපා සංගමය (......)

(16) පහත දැක්වෙන්නේ බලය ලැබෙන මූලාශ්‍ර කිහිපයකි.

A - අධිකාරී බලය
B - විශේෂඥ බලය
C - ත්‍යාග දීමේ බලය
D - බලපෑම් කිරීමේ බලය
E - දඬුවම් දීමේ බලය

ඉහත දෑ අතරින් පුද්ගලයා මත ලැබෙන බලයට පමණක් අයත් වන්නේ,

(1) B හා D පමණි. (2) C හා E පමණි. (3) A හා D පමණි.
(4) A හා B පමණි. (5) D හා E පමණි. (......)

(17) ව්‍යාපාර ආයතනයක කළමනාකරණය විසින් ඉටු කරන කාර්යයන් සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

A - පාරිභෝගික පැමිණිලිවලට මුහුණ දීම
B - මාධ්‍ය සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම
C - අමුත්තන් පිළිගැනීම
D - ආයතනයක භෞතික සම්පත් අංශ අතර බෙදා දීම
E - රජයේ නියෝජිත ආයතන සමග කටයුතු කිරීම
F - අනුගාමිකයන්ගේ ගුණදොස් දැක්වීම

ඉහත දෑ අතරින් තීරණ භූමිකාව අයත් කාර්යන් සඳහා නිදසුන් පමණක් දැක්වෙන්නේ,

(1) A, B, E (2) A, D, E (3) B, D, F
(4) A, C, E (5) B, E, F (......)

(18) නිෂ්පාදිත පිරියත, ක්‍රියාවලි පිරියත, කුටි පිරියත, ස්ථාවර ස්ථානීය පිරියත යන කම්හල් පිරියත සැලසුම් වර්ගවලට වඩාත් ම යෝග්‍ය නිෂ්පාදිත පිළිවෙලින් දැක්වෙන කාණ්ඩය තෝරන්න.

(1) ඇඟලුම්, ගෘහ භාණ්ඩ, මෝටර් රථ, බේකරි නිෂ්පාදන
(2) මෝටර් රථ, ගෘහ භාණ්ඩ, ඇඟලුම්, නාවුක යාත්‍රා,
(3) ඇඟලුම්, මෝටර් රථ, ගුවන් යානා, ගෘහ භාණ්ඩ
(4) මෝටර් රථ, ඇඟලුම්, ගෘහ භාණ්ඩ, ගුවන් යානා
(5) ගෘහ භාණ්ඩ, මෝටර් රථ, ගුවන් යානා, ඇඟලුම් (......)

(19) තොග පාලන ක්‍රම සහ ඒවාට අදාළ කරුණු කිහිපයක් පහත දැක්වේ.

| තොග පාලන ක්‍රම | අදාළ කරුණු |
|---|---|
| i. ABD විශ්ලේෂණ ක්‍රමය | A රඳවා ගනු ලබන තොග ශූන්‍ය ලෙස පවත්වාගෙන යාම |
| ii. jit ක්‍රමය | B රාක්ක පත්‍ර යොදා ගැනීම |
| iii. තොග මට්ටම් නිශ්චය ක්‍රමය | C යළි ඇණවුම් මට්ටම ගණනය කිරීම |
| iv. අඛණ්ඩ තොග වාර්තා කිරීමේ ක්‍රමය | D ද්‍රව්‍ය අයිතමයන්ගේ වටිනාකම හා ඉඩකඩ සැලකිල්ල ගැනීම |

ඉහත සඳහන් තොගපාලන ක්‍රම වලට පිළිවෙලින් ගැළපෙන කරුණු ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) B, A, C, D (2) D, A, C, B (3) D, A, B, C
(4) B, C, A, D (5) B, A, D, C (......)

(20) ''මම නම් මගේ නිෂ්පාදිත ඉදිරිපත් කරන්නේ ඉහළම ක්‍රයශක්තියක් ඇති පාරිභෝගික පිරිසකටයි..'' ඉහත ප්‍රකාශයෙන් ගම්‍ය වන නිෂ්පාදනය මිල කිරීමේ පරමාර්ථය වන්නේ,

(1) වෙළෙඳපොළ සාරය උරා ගැනීමයි.
(2) වර්තමාන ලාභය උපරිම කර ගැනීමයි.
(3) වෙළෙඳපොළේ රැඳී සිටිමයි.
(4) නිෂ්පාදිත ගුණත්ව නායකත්වය ලබාගැනීමයි.
(5) වෙළෙඳපොළ කොටස උපරිම කිරීමයි. (......)

(21) අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන්ට අයත් තොරතුරු පහත සඳහන් වේ.

| | | | |
|---|---|---|---|
| A මහජන සම්බන්ධතා | E දීමනා | I මාර්ග මිශ්‍රය | M සෘජු අලෙවිකරණය |
| B ඇසුරුම | F අංග | J ගෙවීම් කාලය | N ණය කොන්දේසි |
| C ආවරණය | G ප්‍රවාහනය | K වගකීම | |
| D ප්‍රදේශය | H නිර්මාණය | L පෞද්ගලික අලෙවිකරණය | |

ඉහත තොරතුරු අලෙවි මිශ්‍රයේ විචල්‍යයන් සමඟ ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර වන්නේ,

| පිළිතුරු අංකය | නිෂ්පාදිතය | මිල | ස්ථානය | ප්‍රවර්ධනය |
|---|---|---|---|---|
| (1) | BDFH | JKN | ACE | GILM |
| (2) | BFHK | EJN | CDGI | ALM |
| (3) | DFH | EJKJ | CHL | AMNB |
| (4) | CFH | EJN | IKLM | ABDH |
| (5) | FHK | BEJN | CDHI | ALM |

(......)

(22) මූල්‍ය වෙළෙඳපොළ සිදුවන කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

අ - වාණිජ බැංකුවක් තවත් වාණිජ බැංකුවකින් දින තුනකින් පියවීමට ණයක් ගැනීම

ආ - අපනයනකරුවන් විසින් ලබා ගන්නා විදේශ මුදල් වාණිජ බැංකුවට විකුණා ශ්‍රී ලංකා රුපියල් ලබා ගැනීම

ඇ - ආයෝජකයන් භාණ්ඩාගාර බැදුම්කර මිල දී ගැනීම

ඈ - ආයෝජකයන් විසින් මිල දී ගත් කොටස් ද්විතීක වෙළෙඳපොළේ අලෙවි කිරීම

ඉ - රාජ්‍ය සංස්ථාවලට අරමුදල් සපයන ගැනීම සඳහා ණයකර නිකුත් කිරීම

ඉහත කාර්ය අතුරෙන් පිළිවෙලින් මුදල් වෙළෙඳපොළ හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ කාර්යන් ලෙස නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

(1) ආ, ඇ, ඉ හා අ, ඈ
(2) අ, ආ හා ඇ, ඈ, ඉ
(3) අ, ඉ, හා ආ, ඇ, ඈ
(4) අ, ඇ, ඈ හා අ, ඉ
(5) අ, ආ, ඉ හා ඇ, ඈ (......)

(23) කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු වන සුරැකුම්පත් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) සාමාන්‍ය කොටස්, කොටස් බලපත්‍ර, සාංගමික ණයකර, රජයේ සුරැකුම්පත්, කොටස් සහතික පත්‍ර
(2) සාමාන්‍ය කොටස්, වරණීය කොටස්, ඉල්ලුම් තැන්පතු, කොටස් සහතික පත්‍ර. සාංගමික ණයකර
(3) සාමාන්‍ය කොටස්, රජයේ සුරැකුම්පත්, වාණිජ පත්‍රිකා, වරණීය කොටස්, තැන්පතු සහතික
(4) සාමාන්‍ය කොටස්, රජයේ සුරැකුම්පත්, සාංගමික ණයකර, කොටස් බලපත්‍ර, වරණීය කොටස්
(5) සාමාන්‍ය කොටස්, භාණ්ඩාගාර බැදුම්කර, සාංගමික බැදුම්කර, පොරොන්දු නොට්ටු, විනිමය බිල්පත් (......)

(24) මූල්‍ය කළමනාකරුවකු විසින් සම්පාදනය කරගනු ලබන අරමුදල් ආයෝජනය කළ හැකි මාර්ග කිහිපයක් පහත දැක්වේ.

A - කොටස් මිල දී ගැනීම
D - ව්‍යාපාර පුළුල් කිරීමේ
B - අමුද්‍රව්‍ය මිල දී ගැනීම
E - ස්ථාවර වත්කම් මිල දී ගැනීම
C - මාස තුනක ස්ථාවර තැන්පතු මිල දී ගැනීම
F - භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීම

මෙම අරමුදල් ආයෝජන මාර්ග අතරින් කෙටි කාලීන අරමුදල් ආයෝජන මාර්ග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A, D, F (2) B, C, D (3) A, D, E (4) D, E, F (5) B, C, F (......)

(25) ආයතනයක එක්තරා විධායක ශ්‍රේණියේ තනතුරක් සඳහා රැකියා පිරිවිතරයක් සකස් කිරීමට මානව සම්පත් කළමනාකරුවන් අවශ්‍යව ඇත. ඒ සඳහා පහත සඳහන් තොරතුරු අතරින් ඔහු තෝරාගත යුතු තොරතුරු ඇතුළත් වරණය තෝරන්න.

A - තනතුරු නාමය
B - භාෂා දැනුම
C - කායික යෝග්‍යතාවය
D - සේවා කොන්දේසි
E - තනතුර ස්ථිර කිරීම
F - කාර්ය සාධන ඇගයීම් පටිපාටිය
G - ආකල්ප හා ලැදියාව

(1) A, E, F, G (2) A, B, C, G (3) B, C, D, F (4) A, B, D, C (5) A, C, D, F (......)

(26) සේවකයින්ට ඕනෑම වැඩක් සම්බන්ධයෙන් ඕනෑම අවස්ථාවක තම ප්‍රධානීන් හා සන්නිවේදනය හා සමීප වීමට දිරිගන්වමින් සේවකයින් තුළ විශ්වාසය හා ගෞරවයක් ගොඩනැගීම, සේවක දුක්ගැනවිලි විසඳීමට යෝග්‍ය ක්‍රමයක් ලෙස වර්තමාන ආයතන පිළිගනු ලබන ක්‍රමය හඳුන්වන්නේ,

(1) උපදේශනය ලෙස ය.
(2) බේරුම්කරණය ලෙස ය.
(3) විවෘත දොරටු ප්‍රතිපත්තිය ලෙස ය.
(4) දුක්ගන්නා රාළ පත් කිරීම ලෙස ය.
(5) ආසන්නතම ප්‍රධානියා මගින් ලෙස ය. (......)

(27) සැලසුම් සකස් කිරීම, ආකෘති ගොඩනැගීම, විකල්ප ඇගයීම හා තීරණ ගැනීම ආදි විවිධ කළමනාකරණ කටයුතුවල දී යොදා ගන්නා විශ්ලේෂණ හැකියාවෙන් යුතු තොරතුරු පද්ධති වර්ගය වන්නේ,

(1) BIS (2) ESS (3) DSS (4) KWS (5) MIS (......)

(28) පරගණකගත තොරතුරු පද්ධතියක කාර්ය හා උපාංග පාලනය කිරීම සඳහා ස්ථාපිත කර ඇති සම්මුති හා නීතිරීති,

(1) ක්‍රියාපටිපාටි වේ. (2) මෘදුකාංග වේ (3) ආදානය වේ.
(4) ස්ථිරාංග වේ (5) ප්‍රතිදානය වේ. (......)

(29) පහත දැක්වෙන්නේ ව්‍යාපාර සැලැස්මක අංග හා ඒවායේ වැදගත්කම පිළිබඳ අදහස් කිහිපයකි. ඒවා නිවැරදිව ගැලපූ විට,

| | | | |
|---|---|---|---|
| i. | විධායක සාරාංශය | A | තම නිෂ්පාදිත සඳහා වර්ධනය වන වෙළඳපලක් ඇති බව පෙන්වා දීමට |
| ii. | අලවි සැලැස්ම | B | නිෂ්පාදන ක්‍රියාවලිය හා සම්බන්ධ කටයුතු පිළිබඳ අවබෝධය ලබා ගැනීමට |
| iii. | මෙහෙයුම් සැලැස්ම | C | ව්‍යාපාරය සපයනු ලබන භාණ්ඩය හෝ සේවාව පිළිබඳවත් එමගින් ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභය පිළිබඳවත් අවබෝධ කර ගැනීමට |
| iv. | ව්‍යාපාර විස්තරය | D | ආයතනයේ සේවක අවශ්‍යතා දැන ගැනීමට |
| v. | මානව සම්පත් සැලැස්ම | E | ව්‍යාපාර සැලැස්ම පිළිබඳව මගපෙන්වීමක් ඇති කර ගැනීමට |

(1) C, A, B, C, D (2) E, C, A, B, D (3) E, C, A, B, D
(4) E, A, B, C, D (5) C, A, B, D, E (......)

(30) ව්‍යාපාර සැලැස්මක් පිළියල කිරීමේ වැදගත්කම පිළිබඳව කරුණු කිහිපයක් පහත දැක්වේ. ඒවා අතරින් ව්‍යාපාර සැලැස්මක වැදගත්කම අඩු වශයෙන් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) ව්‍යාපාර අනාගතයේ දී යා යුත්තේ කොතැනට ද යන්න හඳුනා ගැනීමට හැකිවේ.
(2) ව්‍යාපාරයේ කාර්ය සාධනය ඇගයීම සඳහා ප්‍රයෝජනයට ගත හැකිවේ.
(3) පාරිභෝගිකයින් විසින් භාණ්ඩ සේවා මිල දී ගැනීමේ තීරණ ගැනීමේ දී යොදා ගත හැකි වේ.
(4) ව්‍යාපාරය පිළිබඳව ඇල්මැති පාර්ශවයන්ට අවබෝධය ලබා දීමට යොදාගත හැකි වේ.
(5) ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් හඳුනා ගැනීමට භාවිතා කළ හැකි වේ. (......)

- **අංක 31 සිට 40 තෙක් වූ ප්‍රශ්නවලට සුදුසු වචන හිස්තැන මත ලියන්න.**

(31) (අ) ''සමාජය තුළ ................................ බලපෑමක් ජනිත කිරීමට ව්‍යාපාර ක්‍රියාවලිය කළමනාකරණය කරන්නේ කෙසේ ද? යන්න පිළිබඳව අදහසකි. සමාජීය වගකීම්'' මෙය .............................. විසින් ඉදිරිපත් කරන ලද නිර්වචනයකි.

(ආ) ISO 26000 ව්‍යාපාරයක .......................................... පිළිබඳ ප්‍රමිතියක් වන අතර ජගත් මිහිතල දිනය .................................. වෙනි දිනට යෙදී ඇත.

(32) (අ) කේවල ස්වාමී ව්‍යාපාරයක් ලියා පදිංචි කිරීමේ දී එම ව්‍යාපාරය අයත් ............................... ව්‍යාපාර නාම ප්‍රඥාපත්තිය යටතේ සිදුකළ යුතු වන අතර ඊට අදාළ ඉල්ලුම් පත්‍රය අදාළ ..................................... ලබාගත හැකිය.

(ආ) හවුල් ව්‍යාපාරයකය ................................ තිබීම අනිවාර්ය වන අතර එහි ආරම්භක ප්‍රාග්ධන රු. 1000/- හෝ ඊට වඩා වැඩි නම් .............................................. තිබීම අනිවාර්ය වේ.

(33) (අ)සමූපකාර සමිතියක අවම සාමාජික සංඛ්‍යාව ................................ ක් වන අතර කොටසක අගය රු. ................................ ක් වේ.

(ආ) වරලත් ලාභියා විසින් ....................................... ගාස්තුව ලෙස විශාල පිරිවැයක් දරා වරලත් ව්‍යාපාර ක්‍රමය ලබාගත යුතු වන අතර ඊට අමතරව මාසික ................................... ගෙවීමට බැඳී සිටී.

(34) (අ) ආන්තික සැපයුම්කරුවන් විසින් සිදුකරනු ලබන්නේ වෙළෙඳ ආයතන විසින් ........................ ලබා දී ඇති ..................................... ණය අය කිරීම සහ ණය මිල දී ගැනීමයි.

(ආ) ණය පතක් යනු කිසියම් නිශ්චිත වටිනාකමක් දක්වා අනුමත වෙළෙඳ ආයතනවලින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට හැකි වන පරිදි ..................................... බැංකුවක් හෝ .......................... ආයතනයක් විසින් නිකුත් කරනු ලබන කාඩ්පත් විශේෂයකි.

(35) (අ) නිෂ්පාදිතවල ........................... හා පරිභෝජනය වෙනස් ස්ථානයන්හි සිදු වන්නේ ..................... නිසාය.

(ආ) ප්‍රවාහනය හුදෙක් මාධ්‍යයක් පමණක් නොව ....................... කිහිපයකින් සමබරව සංවර්ධනය වීමෙන් සැකසුණු ..................................... කි.

(36) (අ) ශ්‍රී ලංකාව වර්ථමානයේ මුහුණ දී සිටින ආර්ථික අර්බුදයෙන් මිදීමට ..................... වෙළඳාම ප්‍රවර්ධනය කළ යුතුය.

(ආ) එක් කළමනාකරුවෙකුට වාර්තා කරනු ලබන සේවක සංඛ්‍යාව ..................... වන අතර සමතල සංවිධානය ව්‍යුහයක් පවතින්නේ නම් එය .................................. ලෙස ද උස සංවිධාන ව්‍යුහයක් පවතින්නේ නම් .................................... ලෙස ද හැඳින්වේ.

(37) (අ) සමච්ඡේදන ලක්ෂ්‍යය ගණනය කිරීම, ........................................... සඳහා මෙන් ම .................. සඳහා ද ප්‍රයෝජනවත් වේ.

(ආ) නිෂ්පාදන ආයතනයක නිතර නිතර කළ යුතු දෘඪ කාර්‍යයන් සඳහාත් ....................... ක්‍රමය යොදා ගත හැකි අතර බොහෝ විට .............................. ක්‍රමයේ දී මෙම ක්‍රමය භාවිතා කිරීම සිදුවේ.

(38) (අ) හිමිකම් ප්‍රාග්ධනයත් ............................................... පොලී අනුපාතයක් ලැබෙන ................................ අතර ඇති සම්බන්ධතාවය පෙන්නුම් කෙරෙන අනුපාතය ණය හිමිකාරිත්ව අනුපාතයයි.

(ආ) වෙළෙඳ පොළ භාණ්ඩයක දී සිදු වන්නේ විෂම ගති ලක්ෂණවලින් යුක්ත ........................... වෙළෙඳපොළ සමජාතීය ගති ලක්ෂණවලින් යුක්ත වූ .................................. බෙදා වෙන් කිරීමයි.

(39) (අ) සේවක දුක්ගැනවිලි ආයතනයේ ......................................................... වලට ඍජුවම බලපාන බැවින් ඒවා මුල් අවස්ථාවේම විසඳා ගත යුතුවේ. එසේ නොවන විට එම නො විසිඳුන දුක්ගැනවිලි ....................................... වල මුල් අඩියර බවට පත්වේ.

(ආ) සේවකයෙක් එක් රැකියාවක සිට සමාන මට්ටමේ වෙනස් රැකියාවකට විතැන් කිරීම ..............................ලෙස හඳුන්වයි. එය .......................................... අතට වූ චලනයකි.

(40) (අ) පුද්ගලයෙකු හෝ සංවිධානයක අවශ්‍යතාවයක් හෝ වුවමානවක් ඉටු කිරීමට හැකි නිෂ්පාදිතයක් පිළිබඳව ව්‍යවසායකයෙකු තුළ ඇතිවන සිතුවිල්ල ................................................ යනුවෙන් හඳුන්වයි. එය සාර්ව හා සූක්ෂම විශ්ලේෂණයන්ට භාජනය කිරිමෙන් ............................................. තීරණය වේ.

(ආ) යම ව්‍යාපාරයක් පිළිබඳ වූ සුවිශේෂී අනන්‍යතාවය .......................................... තුළ ඉදිරිපත් කරයි. එසේම සැලැස්මක මූලික කරුණු ........................................................ මගින් ලඝුකර දක්වයි.

- **ප්‍රශ්න අංක 41 සිට 50 දක්වා වූ ප්‍රශ්න වලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

(41) සීමා සහිත පොදු සමාගම්වල වාසි 04 ක් ලියන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................

(42) ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ මුල් පියවර හතර සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................

(43) නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්වා නිෂ්පාදිත බෙදාහැරීමේ දී සම්බන්ධ නියෝජිතයන් නම් කර ඔවුන්ට හිමිවන ගෙවීම් වර්ග 04 ලියන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................

(44) ව්‍යාපාර ආයතනයකට දෙපාර්තමේන්තුකරණය සිදු කළ හැකි පදනම් 04 ක් ලියන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................

(45) භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතනයකට ද්‍රව්‍ය ඵලදායිතාවය වර්ධනය කර ගැනිම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 04 ක් ලියන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................

(46) හොඳ සන්නමක පැවතිය යුතු ගුණාංග 04 ක් ලියන්න.

1. ..............................................................................................
2. ..............................................................................................
3. ..............................................................................................
4. ..............................................................................................

(47) බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල කාර්යයන් 04 ක් සඳහන් කරන්න.

1. ..............................................................................................
2. ..............................................................................................
3. ..............................................................................................
4. ..............................................................................................

(48) සේවකයින් අභ්‍යන්තරව ආකර්ෂණය කර ගැනීම සඳහා යොදාගන්නා අභ්‍යන්තර ආකර්ෂණ ක්‍රම 4 ක් සඳහන් කරන්න.

1. ..............................................................................................
2. ..............................................................................................
3. ..............................................................................................
4. ..............................................................................................

(49) තොරතුරු වර්ග කළ හැකි පදනම් 4 ක් දක්වන්න.

1. ..............................................................................................
2. ..............................................................................................
3. ..............................................................................................
4. ..............................................................................................

(50) පහත දැක්වෙන්නේ තිරසර සංවර්ධන අභිමතාර්ථ කිහිපයක රූප සටහන්ය. ඒවායින් නිරූපණය වන අභිමතාර්ථ සඳහන් කරන්න.

1. 

.........................................

3. 

.........................................

2. 

.........................................

4. 

.........................................

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024**
**Third Term Test - Grade 13 - 2024**

විභාග අංකයඃ ....................................

# ව්‍යාපාර අධ්‍යයනය - II

කාලය පැය 03 යි
(අමතර කියවීම් කාලය විනාඩි 10 යි)

උපදෙස්:-
- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් වත් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

---

## I කොටස

01. සහන් ප්‍රධාන මාර්ගයට මුහුණලා ඇති තම නිවස ඉදිරිපිට "Coffee Cafe" නමින් ව්‍යාපාරයක් ඇරඹීය. ප්‍රදේශය තුළ බහුල කෝපි ගොවීන්ගෙන් ලබාගත් නැවුම් කෝපි යොදාගෙන ඔහු මෙම ව්‍යාපාරය ක්‍රියාත්මක කළ අතර වනාන්තර ආශ්‍රිතව වැවෙන වටිනා විශාල දැව ප්‍රමාණයක් යොදාගෙන අලෙවි සැලේ වහලය, බිත්ති, බිම ආදි සියලු කොටස් දැවයෙන් අලංකාරව නිමවා තිබීම නිසාම මෙම ව්‍යාපාරය අකාර්ෂනීය ස්භාවයක් ගන්නා ලදී. 2020 වසරේ සිට ලංකාව තුළ ඇති වූ විවිධ අර්බුධකාරී වාතාවරණයන් මෙම ව්‍යාපාරයට ද අයහපත් ලෙස බලපාන ලදී. පසුකාලීනව සහන් මෙම ව්‍යාපාරයට සමගාමීව Green products නමින් ඉහළ ගුණත්වයෙන් යුතු කෝපි කුඩු අපනයනය කිරීමේ ව්‍යාපාරයක් ද ඇරඹීය. මේ සඳහා ඔහු SLS හා ISO ප්‍රමිතින්ද ලබා ගන්නා ලදී.

i. අ) "Coffee Cafe" ව්‍යාපාරය කර්මාන්ත මූලය අනුව හා අරමුණ අනුව කුමන වර්ගයකට අයත්වේද? (ලකුණු 02)

ආ) 2020 වසරේ සිට ශ්‍රී ලංකාව තුළ ඇති වූ ව්‍යාපාරවලට බලපෑ අර්බුධකාරී වාතාවරණයන් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

ii. සහන් Green Products ආයතනයේ අලෙවි ප්‍රවර්ධනය සිදුකර වෙළඳපල පුළුල් කර ගැනීම සඳහා අන්තර්ජාලය භාවිතා කිරීම සුදුසු ද? කෙටියෙන් පැහැදිලි කර ඒ සඳහා යොදාගත හැකි ක්‍රමවේදයන් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04)

iii. පාරිසරික තිරසර බව පිළිබඳව සලකා බැලීමේ දී මෙම ව්‍යාපාරය යම් ගැටළුවක ස්භාවයක් පෙන්නුම් කරයි. පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. අ) "Coffee Cafe" ව්‍යාපාරයේ දක්නට ඇති ශක්තීන් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

ආ) සහන්ගේ ව්‍යාපාරයට සමාජ වගකීම් ඉටු කිරීමෙන් ලබාගත හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

v. අ) "Green Products" ආයතනය ISO 9001, ISO 22000, HACCP සහ GMP යන ප්‍රමිතීන් ලබාගෙන ඇති නම් එම ප්‍රමිතීන් කුමන ආකාරයේ ප්‍රමිතීන් දැයි වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ) 2023 වර්ෂයේ ශ්‍රී ලංකා රජයේ බදු හා බදු නොවන ආදායම රජයේ මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න. (ලකුණු 02)

02. i. ගුණාත්මක ණය සීමා පැනවීම යන්න පැහැදිලි කොට එය හරහා රජයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීම සඳහා පියවර ගත හැක්කේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. අ) නෛතික පුද්ගලභාවයක් සහිත හා නෛතික පුද්ගලභාවයක් රහිත ව්‍යාපාර සංවිධාන **හතරක්** බැගින් සඳහන් කරන්න. (ල. 1/2X 8=02)

ආ) ව්‍යාපාරයකට නෛතික පුද්ගලභාවයක් ලැබීමෙන් ඇතිවන ප්‍රතිලාභ **හතරක්** ලියන්න. (ලකුණු 02)

iii. අ) පහත සඳහන් ව්‍යාපාර සංවිධාන ලියාපදිංචි කිරීමට අදාළ වන පනත ලියන්න.

1. කේවල ස්වාමි ව්‍යාපාර
2. සංස්ථාපිත සමාගම්
3. සමූපකාර ව්‍යාපාර
4. රාජ්‍ය සමාගම් (ලකුණු 02)

ආ) සංස්ථාපිත සමාගම් සම්බන්ධයෙන් පහත සඳහන් ලේඛණ අතරින් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

1. සාංගමික ව්‍යවස්ථාවලිය
2. සංස්ථාපන (සම්මුති) සහතිකය
3. සංස්ථා ප්‍රකාශය (ලකුණු 02)

iv. අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 02)

ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් සපයන රාජ්‍ය ආයතන **දෙකක්** හා වෙනත් ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

v. අ) ව්‍යවසායකත්වය තුළින් නව රැකියා බිහිවේ. මෙලෙස නව රැකියා සම්ප්‍රදානය තුළින් ආර්ථික සංවර්ධනය වේගවත් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ) කාන්තා ව්‍යවසායකයින් මුහුණ දෙන අභියෝග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02)

03. i. අ) බැංකු කටයුතු සඳහා මංගත බැංකුකරණය යොදා ගැනීමෙන් ගනුදෙනුකරුවන්ට අත්වන වාසි හා අවාසි **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ) සෑම වසරකම උත්සව සමයේ දී ණය කාඩ්පත් භාවිතය සීඝ්‍රයෙන් ඉහළ යාමක් දක්නට ලැබේ. මෙම ප්‍රවණතාවය සඳහා බලපාන හේතු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii. අ) ''වර්තමානයේ ශ්‍රී ලංකාවේ උද්ගත වී ඇති අර්බුදකාරී වාතාවරණය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණුවල වැදගත්කම ඉස්මතු වී ඇත.''
නව ශ්‍රී ලංකා මහ බැංකු පණත නම් කර, අරමුණු සම්බන්ධයෙන් එහි ඇති වූ වෙනස සඳහන් කරන්න.

ආ) සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල අතර වෙනස්කම් **දෙකක්** දෙක්වන්න. (ලකුණු 02)

iii. අ) මුදල් විශුද්ධිකරණය යනු කුමක් දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

ආ) වාණිජ බැංකු විසින් තැන්පතු භාර ගැනීම හා ණය සැපයීමට අමතරව ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට බලපාන සේවා රැසක් සපයා දීම සිදු කරයි. ඒ අතරින් නියෝජිත සේවා සැපයීම හා මුදල් ප්‍රේෂණ කටයුතු සිදුකරන ආකාරය නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 02)

iv. අ) ''රක්ෂණ ගිවිසුමක් වලංගු වීම සඳහා නෛතික බව නමැති මූලිකාංගය පමණක් පැවතීම ප්‍රමාණවත් වේ.'' සාකච්ඡා කරන්න. (ලකුණු 02)

ආ) මරණයක දී වන්දි ලැබීම හැරුණු විට ජීවිත රක්ෂණ ආවරණයක් සලසා ගෙන ඇති අයෙකුට එමගින් ලැබෙන වෙනත් ප්‍රතිලාභ **හතරක්** නම් කරන්න. (ලකුණු 02)

v. අ) සන්නිවේදනය ව්‍යාපාරවලට මෙන්ම සමාජයේ වෙසෙන සියළුම දෙනාටම වැදගත් වේ. එසේ සමාජීය කටයුතු සඳහා සන්නිවේදනය වැදගත් වන බව කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ) අවිධිමත් සන්නිවේදනය යනු කුමක් දැයි හඳුන්වා, ඒ සඳහා උදාහරණ **දෙකක්** දෙන්න. (ලකුණු 02)

04. i. අ) උචිත ප්‍රවාහන මාධ්‍යයන් තෝරා ගැනීමේ දී ''සුරක්ෂිත බව'' පිළිබඳව සැලකිලිමත් විය යුතුය. මෙහි සඳහන් සුරක්ෂිත බව, උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

ආ) ගොඩබිමින් වැඩිම මගීන් හා භාණ්ඩ ප්‍රමාණයක් ප්‍රවාහනය කළ හැක්කේ දුම්රිය මගින් වුවද, දුම්රිය ප්‍රවාහන ක්‍රමයේ අවාසි ද පවතී. එවැනි අවාසි **දෙකක්** ලියන්න.

ii. අ) ගබඩාවක් සඳහා ගොඩනැගිල්ලක් තෝරා ගැනීමේ දී ගොඩනැගිල්ලේ පිරියත සැලැස්ම පිළිබඳව සැලකිලිමත් විය යුතුයි. මේ යටතේ අවධානය යොමු කළ යුතු කරුණු **හතරක්** ලියන්න.

ආ) ''සී/ස කුමාර ප්‍රඩක්ෂන්'' ආයතනය විසින් සිදුකරනුයේ දේශීය ගොවීන්ගේ මිරිස්, ගම්මිරිස්, කුරහන් ආදී දෑ මිල දී ගෙන පැකට් කර දේශීය වශයෙන් බෙදා හැරීමයි. (ලකුණු 02)
''සී/ස කුමාර ප්‍රඩක්ෂන්''ආයතනය අනුගමනය කරන ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති වර්ගය කුමක් ද? පැහැදිලි කරන්න. (ලකුණු 02)

iii. අ) වෙළඳාම නිර්වචනය කරන්න. (ලකුණු 02)

ආ) සිල්ලර වෙළෙන්දා නොමැති පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීමේ මාර්ගයක් තිබුණ ද සිල්ලර වෙළඳාම නොමැතිව පාරිභෝගික වුවමනා තෘප්තිමත් කළ නොහැකි බව පැහැදිලි කරන්න. (ලකුණු 02)

iv. අ) පාවිච්චි කළ වාහන සහ තමන් සතු ඉඩම් ආදිය විකිණීමේ දී මෙන්ම මිල දී ගැනීමේ දී බ්‍රෝකර්වරුන්ගේ සේවය ලබයා ගැනීම අදටත් බහුලව සිදුවේ. එසේ බ්‍රෝකර්වරුන්ගේ සේවය ලබා ගැනීමේ වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

ආ) වෙළඳාම සඳහා අතරමැදියන් යොදා ගැනීමේ වාසි සඳහන් කරන්න. (ලකුණු 02)

v. අ) 2023 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආනයන වියදම් වල කැපී පෙනෙන පහළ යෑමක් දක්නට ලැබුණි. මේ සඳහා බලපෑ හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 02)

ආ) විදේශ වෙළඳාමේ දී මුදල් ගෙවීම සඳහා භාවිතා කරන ක්‍රම සඳහන් කරන්න. (ලකුණු 02)

## II කොටස

05. ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ සමාගමක අධ්‍යක්ෂකවරයෙකු විසින් සිදු කළ ප්‍රකාශයකින් උපුටා ගත් කොටසක් පහත දැක්වේ.

''අපේ ආයතනයේ දියුණුවට හේතුව ආයතනයේ සේවකයන් හා කළමනාකරුවන් අතර හොඳ අවබෝධයක් තිබීමයි. අපි සේවකයන්ගේ අදහස් හා යෝජනාවලට සෑම විටම ඇහුම්කන් දෙනවා. ඒ වගේම සේවකයන්ට අවශ්‍ය උපදෙස් හා තොරතුරු නිසි වේලාවට සුහදශීලීව ලබා දෙනවා. සමහර වේලාවට ආයතනයේ කටයුතු පිළිබඳව තීරණ ගැනීමේ දී නිර්ණාමිකව විටින් විට අපිට ලැබෙන තොරතුරු ප්‍රයෝජනයට ගන්නවා.''

i. අ) මෙම සිද්ධිය ඇසුරින් ඉහත ආයතනය පිළිබඳව ඔබට එළඹිය හැකි නිගමන **දෙකක්** ලියන්න. (ලකුණු 02)

ආ) සංවිධාන ධුරාවලියේ පහළ සිට ඉහළට සන්නිවේදනය කෙරෙන තොරතුරු **දෙකක්** දක්වන්න. (ලකුණු 02)

ii. අ) මෙම ආයතනයේ ක්‍රියාත්මක වන නායකත්ව ශෛලිය කුමක් විය හැකිද? හේතු දක්වන්න. (ලකුණු 02)

ආ) මෙම ආයතනයේ සේවක අභිප්‍රේරණය සඳහා යොදා ගත හැකි මූල්‍යමය නොවන ක්‍රම **හතරක්** ලියන්න. (ලකුණු 02)

iii. සැලසුම්කරණ ක්‍රියාවලියේ දී ගැටලු පැනනැගීමට බලපාන හේතු **හතරක්** ලියන්න. (ලකුණු 04)

iv. ''මෙහෙයුම් කටයුතු'' හා ''මෙහෙයුම් කළමනාකරණය'' යන්න වෙන් වෙන් ව හඳුන්වා දෙන්න. (ලකුණු 04)

v. ''තොග පාලන ක්‍රම'' හා ''ගුණත්ව පාලන ක්‍රම'' **හතර** බැගින් නම් කරන්න. (ලකුණු 04)

06. i. එක්තරා ව්‍යාපාර ආයතනයක තොග සම්බන්ධව ද්‍රව්‍ය අයිතමයකට අදාළ කරුණු කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| අවම ද්‍රව්‍ය පරිභෝජනය | - | දිනකට ඒකක 40 |
| උපරිම ද්‍රව්‍ය පරිභෝජනය | - | දිනකට ඒකක 100 |
| යළි ඇණවුම් කාලය | - | අවමය දින 10 |
| | | උපරිමය දින 16 |
| යළි ඇණවුම් ප්‍රමාණය | - | ඒකක 2000 |

පහත දෑ ගණනය කරන්න.

1. යළි ඇණවුම් මට්ටම
2. අවම තොග මට්ටම
3. උපරිම තොග මට්ටම
4. සාමාන්‍ය තොග මට්ටම (ලකුණු 04)

ii. අ) භාණ්ඩයක ජීවන චක්‍රය නමැති න්‍යායාත්මක සංකල්පය ගොඩනැගීම යොදා ගෙන ඇති උපකල්පන **හතරක්** නම් කරන්න. (ලකුණු 02)

ආ) භාණ්ඩයක ජීවන චක්‍රයේ පහත සඳහන් අධියර කෙටියෙන් පැහැදිලි කරන්න.

1. භාණ්ඩ සංවර්ධන අදියර
2. පිරිහීමේ අදියර (ලකුණු 02)

iii. එක්තරා නිෂ්පාදන ආයතනයක් රෙදි සෝදන සබන්, ඇඟ ගල්වන සබන් හා හඳුන් කූරු නිෂ්පාදනය කරයි. රෙදි සෝදන සබන් රෝසමල් සුවඳ, පිච්චමල් සුවඳ සහ දෙහි සුවඳ වශයෙන් වර්ග තුනක් යටතේ නිෂ්පාදනය කරන අතර දෙහි සුවඳ රෙදි සෝදන සබන් ග්‍රෑම් 50, ග්‍රෑම් 75, ග්‍රෑම් 100 සහ ග්‍රෑම් 125 වශයෙන් ප්‍රමාණ හතරකින් නිෂ්පාදනය කරයි. ඇඟ ගල්වන සබන් පිච්ච මල් සුවඳ, අරලිය මල් සුවඳ, සපුමල් සුවඳ හා නාමල් සුවඳ වශයෙන් ප්‍රභේද හරතක් යටතේ නිෂ්පාදනය කරයි. හඳුන්කූරු නාමල් සුවඳ, සපුමල් සුවඳ හා පිච්ච මල් සුවඳ වශයෙන් ප්‍රභේද තුනක් යටතේ නිෂ්පාදනය කරයි.
මෙම ආයතනයේ නිෂ්පාදිත මිශ්‍රයේ දිග, පළල, ගැඹුර සඳහන් කරන්න. (ලකුණු 04)

iv. සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පයේ අංග නම් කර ඉන් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 02)

v. අ) ආයෝජකයකුට කොටස් වෙළෙඳපොළේ හුවමාරු වන සුරැකුම්පත්වල ආයෝජනය කිරීමෙන් අත් වන වක්‍ර ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02)

ආ) සීමිත පොදු සමාගමක් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ දී තම සමාගම් නාමය ඇතුළත් කළ හැකි එක් පුවරුවක් දිරිසවි පුවරුවයි. එම දිරිසවි පුවරුව යන්න පැහැදිලි කර දිරි සවි පුවරුවේ ලැයිස්තුගත වීමට සපුරාලිය යුතු අවශ්‍යතා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

07\. i. අ) මූල්‍ය උපකරණවල කල් පිරිමේ කාලය පදනම් කරගෙන මූල්‍ය වෙළෙඳපොළ වර්ග කිරීමේ දී මුදල් වෙළෙඳපොළෙහි අන්තර්ගත වන උප වෙළෙඳ පොළවල් **හතර** නම් කරන්න. (ලකුණු 02)

ආ) මූල්‍ය කළමණාකරුවකුට මූල්‍ය කළමනාකරණ තීරණ ගැනීමේ දී කෙටිකාලීන ආයෝජන තීරණ ගැනීමට සිදුවන අවස්ථා **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02)

ii. මුදල් අයවැය ලේඛනය යන්න පැහැදිලි කර මුදල් අයවැය ලේඛනයක් පිළියෙල කිරීමෙන් ව්‍යාපාරිකයාට අත් වන ප්‍රතිලාභ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 04)

'සුවපා' පාවහන් නිෂ්පාදන ආයතනයේ සේවකයින් 200 ක් පමණ රැකියාවේ නිරතව සිටිය ද මෙම වර්ෂය ආරම්භයේ ඉන් 50 ක් පමණ ඉවත්ව ගොස් ඇත. ඉතිරිව සිටින සේවකයින් ද ආයතනය පිළිබඳ යහපත් ආකල්පයක් නොදක්වන අතර, අවශ්‍ය පොදු පහසුකම් හෝ රැකියාව ආශ්‍රිත ප්‍රතිලාභ කිසිවක් කළමනාකාරීත්වය ඔවුන්ට ලබා නොදෙන බවත් සේව්‍යයා ඔවුන්ගේ යුතුකම් ඉටු නොකරන බවටත්, චෝදනා කරයි. කළමනාකරණයේ අදහස වන්නේ සේවකයින් තම වැඩ කොටස නිසි පරිදි ඉටු නොකරන නිසා ආයතනයේ ඵලදායකත්වය පහත වැටී ඇති බවයි.

iii. අ) ඉහත ව්‍යාපාරයේ සේවකයින් තෘප්තිමත් කිරීම සඳහා කළමනාකාරීත්වය අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 02)

ආ) තෘප්තිමත් / අභිප්‍රේරණය නොවූ සේවකයින් සිටිමෙන් ආයතනයකට ඇතිවන අහිතකර ප්‍රතිඵල මොනවාද? (ලකුණු 02)

iv. අ) 'සුවපා' ආයතනය තුළ මනා මානව සම්පත් කළමනාකරණයක් සිදු වී ඇති ද නොමැති ද යන්න හඳුනා ගැනීමට භාවිතා කළ හැකි නිර්ණායක 04 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ) සුවපා ආයතනයේ සේවකයින් පවසන පරිදි ඕනෑම ආයතනයක සේව්‍යයාට ඇති යුතුකම් මොනවාද? (ලකුණු 02)

v. අ) යම් පුරප්පාඩුවක් සඳහා සුදුසු පුද්ගලයින් අද්දවා ගැනීම සේවක ආකර්ෂණයයි. එය පියවර කිහිපයකින් යුතු ක්‍රියාවලියකි. පහත සඳහන් ආකර්ෂණ ක්‍රියාවලියේ හිස්තැනට අදාළ කොටස් සඳහන් කරන්න.

A ........................................................................
B රැකියා නියමයන් අධ්‍යයනය
C ........................................................................
D අයදුම්පත පිලියල කිරීම
E ........................................................................
F ක්‍රියාත්මක කිරීම
G ........................................................................ (ලකුණු 02)

ආ) ''සෑම විටම යෝග්‍ය වන්නේ සේවකයින් අභ්‍යන්තරයෙන් ආකර්ෂණය කර ගැනීමයි.'' මෙම ප්‍රකාශන හා ඔබ එකඟ වන්නේ ද හේතු සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 02)

08\. i. දත්ත තොරතුරු බවට පත් කිරීම සාම්ප්‍රදායිකව මිනිසුන් විසින් අත්හුරු ක්‍රමයට සිදු කළ ද වර්තමානයේ එම ක්‍රියාවලිය සිදුවන්නේ පරිගණක ආශ්‍රිතවය. එය නව ව්‍යාපාරික ප්‍රවණතාවයක් බවට ද පත්ව ඇත.

අ) එසේ ව්‍යාපාරවල දත්ත සැකසීමේ කටයුතු සඳහා පරිගණක තාක්ෂණය යොදා ගැනීම නිසා ව්‍යාපාරිකයාට සැලසී ඇති හිතකර තත්වයන් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ) පරිගණකගත තොරතුරු පද්ධතියක උපාංග අතරින් මෘදුකාංග (Software) යනු ප්‍රධානතම උපාංගයකි. මෘදුකාංග වර්ග කළ හැකි ප්‍රධාන කොටස් දෙක උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii. අ) තොරතුරු තාක්ෂණය කොතරම් ආයතනික / සාමාජීය ප්‍රතිඵල සහිත වුවද එහි යම් යම් සීමාවන් ද පවතී. එවැනි සීමා 4 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

ආ) කෘතිම බුද්ධිය (AI) යනු කුමක් දැයි පැහැදිලි කර ව්‍යාපාරයක් කෘතිම බුද්ධිය යොදා ගන්නා අවස්ථා දෙකක් සඳහා උදාහරණ සපයන්න. (ලකුණු 02)

iii. ''තොරතුරු පද්ධති නිර්ණායක කිහිපයක් යටතේ වර්ග කළ ද ඒවා අතර අන්තර් සම්බන්ධතාවයක් පවතී.''

භාවිතය අනුව තොරතුරු පද්ධති වර්ග කිරීම හා කළමනාකරණ මට්ටම් අනුව තොරතුරු පද්ධති වර්ග කිරීම අතර සම්බන්ධතාවය රූප සටහනක් මගින් දක්වන්න. (ලකුණු 04)

iv. ව්‍යාපාර සැලැස්මට අනුව ව්‍යාපාර අදහසේ ශක්‍යතාවය ඇගයීම සඳහා භාවිත කරන මූල්‍ය මිණුම් ක්‍රම/ දඬු හා මූල්‍ය නොවන මිනුම් ක්‍රම **දෙකක්** බැගින් දක්වන්න. (ලකුණු 02)

v. අ) ව්‍යාපාර සැලැස්මක් තුළ අලෙවිකරණ සැලැස්ම යනු ප්‍රධාන කොටසකි. එහි ඇතුළත් කරුණු අතරින්, තරඟකාරීත්ව විශ්ලේෂණය යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ) ව්‍යාපාරයක් විසින් ව්‍යාපාර සැලැස්මක් පිළියල නොකිරීම නිසා මුහුණ දීමට සිදුවිය හැකි ගැටළු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය - 2024

**13 ශ්‍රේණිය** **ව්‍යාපාර අධ්‍යයනය** **පිළිතුරු පත්‍රය**

## I පත්‍රය

1 -(4) 2 -(3) 3 -(2) 4 -(5) 5 -(3) 6 -(4) 7 -(1) 8 -(1) 9 -(5) 10-(1)
11-(3) 12-(5) 13-(4) 14-(2) 15-(2) 16-(1) 17-(2) 18-(2) 19-(2) 20-(1)
21-(2) 22-(2) 23-(4) 24-(5) 25-(2) 26-(3) 27-(5) 28-(1) 29-(4) 30-(3)

(31) (අ) ධනාත්මක, මාලන් බේකර් (ආ) සමාජ වගකීම, අප්‍රේල් 22
(32) (අ) පළාත් සභාවේ / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක
(ආ) ගිවිසුමක් / ලිඛිත
(33) (අ) 10 / 100 (ආ) මූලික / පුරස්කාරය
(34) (අ) ගනුදෙනුකරුවන්ට , වෙළඳ (ආ) වාණිජ , බලයලත් / මූල්‍ය
(35) (අ) නිෂ්පාදනය . ප්‍රවාහනය (ආ) මූලිකාංග, පද්ධතිය
(36) (අ) අපනයනය (ආ) පාලන අවකාශය /පුළුල් පාලන අවකාශය / පටු පාලන අවකාශය
(37) (අ) නිෂ්පාදන සැලසුම් කරණය , මිල නියම කිරීම
(ආ) පරිගණක ආධාරක නිෂ්පාදන ක්‍රමය (CAM)
ප්‍රවාහ නිෂ්පාදනයේ ද
(38) (අ) ස්ථිර, ප්‍රාග්ධනය / ණය ප්‍රාග්ධනය (ලකුණු 1/2 බැගින් ලකුණු 1)
(ආ) සමස්ත, කණ්ඩායම්වලට (ලකුණු 1/2 බැගින් ලකුණු 1)
(39) (අ) කාර්‍යඵල , කාර්මික ආරවුල් (ආ) මාරු කිරීම, තිරස්
(40) (අ) ව්‍යාපාර අදහස, ව්‍යාපාර අවස්ථාව (ආ) මුල් පිටුව, විධායක සාරාංශය
(41) 1. විශාල ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකි වීම 2. තම කොටස් නිදහසේ පැවරිය හැකි වීම
3. කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තු ගත විය හැකිය. 4. මහ පරිමාණ පිරිමැසුම් වාසි ලබාගත හැකි වීම
5. විශාල ආයෝජනයක් සම්බන්ධ කරගත හැකි වීම
(42) 1. නව්‍යතා සම්පාදනය 2. ව්‍යාපාර සංකල්පය ගොඩනැගීම
3. අවශ්‍ය සම්පත් සම්පාදනය 4. යථාර්ථයක් බවට පත් කිරීම
(43) කොමිස් නියෝජිත - කොමිස් මුදලක් බ්‍රෝකර්වරු /තැරැවුකරු - තැරැවුකාර ගාස්තු
සාධ්‍යකයා - කොමිස් කැපකරු නියෝජිතයා - කැපකරු කොමිෂන්
වෙන්දේසිකරු - වෙන්දේසි ගාස්තු
(44) 1. ශ්‍රිතමය පදනම 2. නිෂ්පාදිත පදනම
3. ගනුදෙනුකරු පදනම 4. භූගෝලීය පදනම
5. න්‍යාස පදනම 6. මිශ්‍ර පදනම
(45) 1. ඉහළ තත්ත්වයෙන් යුතු අමුද්‍රව්‍ය යොදා ගැනීම
2. අපතය හා නාස්තිය අවම කර ගැනීම
3. ද්‍රව්‍ය නැවත නැවත භාවිතයට ගැනීම හා ප්‍රතිචක්‍රීකරණය
4. ප්‍රශස්ත ආකාරයෙන් ද්‍රව්‍ය තොග පවත්වා ගෙන යාම
(46) 1. කෙටි හා සරල වීම 2. උච්චාරණය, හඳුනා ගැනීම සහ මතක තබා ගැනීම පහසු වීම
3. කිසියම් සංස්කෘතිකයක් නියෝජනය වීම
4. තරගකරුවන්ගේ සන්නම්වලට වඩා වෙනස් විය යුතු වීම
5. පහසුවෙන් වෙනත් භාෂාවකින් ද හැඳින්විය හැකි වීම
6. නිෂ්පාදිතයේ මූලික ගුණාංග, ප්‍රයෝජ්‍යතාව පිළිබඳ අදහසක් ඇගවීම (කරුණු 4කට ලකුණු 2)
(47) 1. කල්බදු මූල්‍යකරණය 2. කෙටිකාලීන ණය සැපයීම 3. කාලීන තැන්පතු භාර ගැනීම
4. දේපල හා ඉඩම් වෙළෙඳාම් කිරීම 5. කුලිපිට ගැනුම්පහසුකම් සැපයීම
6. රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම
(48) 1. රැකියා දැන්වීම් පළ කිරීම 2. කුසලතා ඉන්වෙන්ට්‍රි / කුසලතා ලේඛනය . 3. අභ්‍යන්තර ජාලය
4. අභ්‍යන්තර සේවකයින් මගින් හඳුන්වා දීම 5. අනුප්‍රාප්තික සැලැස්ම 6. අභ්‍යන්තර ජාලය
(49) 1. මූලාශ්‍රයට අනුව 2. ස්වභාවය අනුව 3. කාලය අනුව 4. නියත හා සම්භාවිතාව අනුව
(50) 1. දුප්පත්කම තුරන් කිරීම 2. සාගිනි නිවාරණය 3. සෞඛ්‍ය සහ යහපැවැත්ම 4. ගුණාත්මක අධ්‍යාපනය දත්ත)

# II පත්‍රය

## II කොටස

01. i. අ) කර්මාන්ත මූලය අනුව - සේවා අංශය (ල. 1)
අරමුණු අනුව - ලාභ අරමුණුකරගත් (ල. 1)

ආ) * කොවිඩ් - 19 (Covid - 19) වසංගතය
* විදේශ විනිමය සංචිත ගැටළු
* විදේශීය ණය ගෙවීම් පිළිබඳ අර්බුධය
* විටින් විට ඇති වූ දේශපාලන අස්ථාවරත්වයන්
* සමස්ථ ආර්ථික අර්බුධය (කරුණු 2 කට ල. 2)

ii. "Green Products" ජාත්‍යාන්තර වෙළඳපල පදනම් කරගත් ආයතනයකි. එබැවින් අලෙවි ප්‍රවර්ධනය උදෙසා වඩාත් යෝග්‍යතාව ක්‍රමයක් ලෙස අන්තර්ජාලය යොදා ගැනීම සුදුසුවේ. මන්දයත් එකවර සමස්ථ ලෝක වෙළඳපල උදෙසා ප්‍රචාරණය සිදු කළ හැකි පිරිවැය අවම ක්‍රමවේදය අන්තර්ජාලය වීමයි. (ල. 2)

* Fb, Tiktok, youtube වැනි සමාජ මාධ්‍ය ජාලය
* තමාගේම වෙබ් අඩෙවියක් හා අනෙකුත් වෙබ් අඩෙවි තුළ දැක්වීම් පල කිරීම
* Alibaba, Amazon වැනි e-commerce වෙබ් අඩෙවි යොදාගෙන අන්තර්ජාල අලෙවි කිරීමේ ක්‍රමවේදයක් භාවිතා කිරීම

(ඉහත කරුණු වැනි ගැලපෙන කරුනු 02 ට ලකුණු 02)

iii. මෙම ව්‍යාපාරය (coffee cafe) වනාන්තර ආශ්‍රිතව වැවෙන වටිනා විශාල දැ ප්‍රමාණයක් යොදාගෙන තම අලෙවි සැල වහලය, බිත්ති, බිම7 ආදි සියලු කොටස් දැවයෙන් නිමවා ඇත. මේ සඳහා විශාල ගස් ප්‍රමාණයක් කපා දමන්නට ඇත. මෙය පරිසරයට සිදුකර ඇති විශාල හානියකි. ගොඩනැගිල්ලක වහලය, බිත්ති, බිම ආදි දැවයෙන් නිම කිරීම අත්‍යවශ්‍ය නොවන කටයුත්තකි. එවැනි කටයුත්තක් උදෙසා දැඩි පරිසර විනාශයක් සිදු කිරීම පාරිසර තිරසර බව උදෙසා මෙම ව්‍යාපාරයෙන් එල්ල වූ දැඩි තර්ජනයකි. (ල. 04)

iv. අ) * ප්‍රධාන මාර්ගයට මුහුණලා පිහිටා තිබීම
* සම්පූර්ණයෙන්ම දැවයෙන් නිර්මාණය කිරීම නිසා ලැබී ඇති ආකර්ශනීය බව (වෙළෙඳසැලේ නිමාව) (කරුණු 2 ට ල. 2)

ආ) * ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම
* ව්‍යාපාරයේ ප්‍රතිරූපය / කීර්තිනාමය වර්ධනය වීම
* ව්‍යාපාරය පිළිබඳව විශ්වාසනීයත්වය තහවුරු වීම
* ගනුදෙනුකරුවන් තෘප්තිමත් කළ හැකි වීම
* ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ කරා ලඟා වීමට පහසුවීම (කරුණු 2 කට ල. 2)

v. අ) ISO 9001 - තත්ව කළමණාකරණ පද්ධති පිළිබඳ ප්‍රමිතියකි.
ISO 22000 - ආහාර සුරක්ෂිතතා කළමනාකරණ ප්‍රමිතයකි.
HACCP - උපද්‍රව විශ්ලේෂණ හා අතිඅවදානම් ලක්ෂණ පාලන ප්‍රමිතියකි.
GMP - යහ නිෂ්පාදන පිලිවෙත් පිළිබඳ ප්‍රමිතියකි. (කරුණු 4ට ල. 02)

ආ) බදු ආදායම - 89.2%
බදු නොවන ආදායම - 10.8% (කරුණු 2 ට ල. 2)

02. i. ගුණාත්මක ණය සීමා පැනවීම හරහා ආර්ථිකයක ණය ගලායන දිශාව පාලන කිරීම සිදුවේ. මෙහි දී ආර්ථිකයක දිරිගැන්විය යුතු ක්ෂේත්‍ර සඳහා ණය ගලා ඉහළ දැමීමටත් අධෛර්යමත් විය යුතු ක්ෂේත්‍ර සඳහා ණය ගලායාම සීමා කිරීම සිදු කළ හැකිය. (ල. 2)
ගුණාත්මක ණය සීමා පැනවීම හරහා රජයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දෙසට ගලායන ණය ප්‍රමාණය ඉහළ දැමිය හැක. මෙය එම ක්ෂේත්‍ර දිරිගැන්විය හැකි ප්‍රධාන ක්‍රමවේදයකි. (ල. 2)

ii. අ)

| සහිත | රහිත |
|---|---|
| රාජ්‍ය සංස්ථා | කේවල් ස්වාමි ව්‍යාපාරය |
| සමූපකාර | හවුල් ව්‍යාපාර |
| වරලත් ව්‍යාපාර | බද්ධ ව්‍යාපාර |
| රාජ්‍ය සමාගම් | සමිති ව්‍යාපාර |
| සීමා රහිත සමාගම් | |

ආ) 1. ව්‍යාපාරයේ නමින් නඩු පැවරීමටත්, පැවරුම් ලැබීමටත් හැකි වීම
2. ව්‍යාපාරයේ නමින් වත්කම් අත්පත් කර ගත හැකි වීම
3. ව්‍යාපාරයේ නම කවරෙකුට හෝ පැවරිය හැකි වීම
4. ව්‍යාපාරයේ නමින් ගිවිසුම්වලට එළැඹීමට පුළුවන
5. ව්‍යාපාරයට අයිතිකරුගේ නමින් වෙන් වූ අඛණ්ඩ පැවැත්මක් හිමිවේ.

iii. අ) 1. 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥාපනත

2. 2007 අංක 07 දරණ සමාගම් පනත
3. 1972 අංක 05 දරණ සමූපකාර සමිති පනත
4. 2007 අංක 07 දරණ සමාගම් පනත

ආ) සාංගමික ව්‍යවස්ථාවලිය
සමාගම හා එහි කොටස්කරුවා අතර සම්බන්ධය දක්වන ප්‍රධාන ලියවිල්ලයි. සමාගමේ අභ්‍යන්තර පරිපාලනයට අදාළ විධිවිධාන මෙහි ඇතුළත් වේ.
සංස්ථාපන සහතිකය
අදාළ සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව සියලු නියමයන් සපුරා ඇති බවත් මෙහි සඳහන් වන දිනයේ සිට සමාගමක් ලෙස සංස්ථාගත කර ඇති බවත් සහතික කරමින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලබන ලියවිල්ලකි.
සංස්ථා ප්‍රකාශය
සීමා සහිත පොදු සමාගමක් කොටස් හෝ ණයකර මිල දී ගන්නා ලෙසට මහජනතාවට ආරාධනා කරමින් ප්‍රසිද්ධ කරනු ලබන ඕනෑම ආකාරයක දැන්වීමකි. එය ගුවන්විදුලි, රූපවාහිනි, චක්‍ර ලේඛ හෝ සඟරාමය දැන්වීමක් විය හැකිය.

iv. අ)
1. වෙළෙඳපල කුඩා වීම — 2. ආයෝජිත ප්‍රාග්ධනය කුඩා වීම
3. සේවක සංඛ්‍යාව කුඩා වීම — 4. භාවිතා කරන විදුලි බල ධාරිතාව අඩු වීම
5. පවුලේ ශ්‍රමය වැඩිපුර භාවිතා කිරීම — 6. තීරණ ගැනීම තමා සතු තොරතුරු මත පමණක් සිදුවීම
7. අයිතිකරුම ප්‍රධාන කළමනාකරු වීම — 8. වෙළෙඳ පොළ බොහෝ විට දේශීය වීම
9. බොහෝ විට මූල්‍ය බැඳීම් අඩු වීම — 10. නවීන තාක්ෂණය භාවිතය අඩු වීම

ආ) රාජ්‍ය ආයතන
කාර්මික සංවර්ධන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, කාර්මික තාක්‍ෂණ ආයතනය
රාජ්‍ය නොවන
සර්වෝදය, ජයිකා, සනස, පෞද්ගලික බැංකු, බදු වාර්තා සකස් කර දෙන පෞද්ගලික ආයතන

v. අ) රැකියා අවස්ථා → ආදායම් මට්ටම ඉහළයාම → ක්‍රය ශක්ති ඉහළ යාම → භාණ්ඩ ඉල්ලුම වැඩි වීම → නිෂ්පාදන වැඩි වීම (ල. 2)

ආ)
* පුරුෂාධිපත්‍යය
* මූල්‍ය ආයතන ඇතුළු සහයෝගය දෙන ආයතනවලින් ඇති අඩු පිළිගැනීම
* නිවසේ වැඩ කටයුතු
* ආගම්වලින් හා සංස්කෘතියෙන් පවතින අඩු පිළිගැනීම (කරුණු 4 ට ල. 2)

03. i. අ) වාසි
1. කාලය ඉතිරි වීම — 2. පහසුව හා වේගවත් වීම
3. දවසේ ඕනෑම වේලාවක ගනුදෙනු කළ හැකි වීම (1/2 බැගින් ල. 1)

අවාසි
1. තාක්ෂණික බාධා ඇති වීම
2. ගනුදෙනුවල දී වංචනික සිදු විය හැකි වීම
3. අන්තර්ජාල පහසුකම් පැවතිය යුතු වීම (1/2 බැගින් ල. 1)

ආ)
1. උත්සව සමයේ දී ව්‍යාපාරිකයින් අලෙවිය වැඩි කර ගැනීම සඳහා ආකර්ෂණ වට්ටම් හා වෙනත් පහසුකම් රැසක් සැපයීම
2. උත්සව සමයේ දී පාරිභෝගිකයින්ගේ මිල දී ගැනීම් ඉහළ මට්ටමක පවතින අතර මුදල් නොමැති වුවද මිල දී ගැනීම් කිරීමට අවස්ථාව උදා වීම. (පැහැදිලි කිරීම සහිත පිළිතුරු 2 ට ල. 2)

ii. අ) 2023 අංක 16 දරණ මහා බැංකු පනත
ප්‍රධාන අරමුණ : දේශීය මිල ස්ථායිතාවය
වෙනත් අරමුණ : මූල්‍ය පද්ධති ස්ථායිතාවය (ල. 2)

ආ)

| | සේවක අර්ථ සාධක අරමුදල | සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල |
|---|---|---|
| 1. | කම්කරු කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරයි. | සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් පරිපාලනය කරයි. |
| 2. | පොලියට අමතරව සීමිත ප්‍රතිලාභ හිමිවේ. | පොලියට අමතරව වැඩි ප්‍රතිලාභ හිමිවේ. |
| 3. | අරමුදල කළමනාකරණය කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව සතුය. | ශ්‍රී ලංකා මහ බැංකුවේ සම්බන්ධතාවක් නොමැත. |

(ල. 2)

iii. අ) උපයාගත් ආකාරයට හෙළිදරව් කිරීමට අසමත් මුදල් (කලු මුදල්) නීතියානුකුල මුදල් සේ භාවිතයට යෙදවීම (ල. 2)

ආ) වාණිජ බැංකු විසින් ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවල දී ගනුදෙනුකරුවන් වෙනුවෙන් පෙනී සිටිමින් කටයුතු කරයි.
නිදසුන් : ගනුදෙනුකරුවන් වෙනුවෙන් සුරැකුම්පත් මිලට ගැනීම හා විකිණීම

ජංගම ගිණුම් හිමියන්ගේ ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම

විදුලි බිල්පත් හා ජල බිල්පත් ගෙවීම

ගිණුම් හිමියා වෙනුවෙන් ඔහුට ලැබීමට ඇති මුදල් ඔහුගේ ගිණුමට රැස්කර දීම සිදුකරයි.

නිදසුන් : සමාගම්වල ආයෝජනය කිරීමෙන් ලැබෙන ලාභාංශ රැස් කිරීම

ආයෝජන ආදායම්, පොලී ආදායම්

iv. අ) රක්ෂණ ගිවිසුමක් වලංගු වීම සඳහා නෛතික බව නමැති මූලිකාංගයක් පමණක් පැවතීම ප්‍රමාණවත් නොවේ. ඊට අමතරව නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ අදහස, යෝජනාව හෙවත් අර්පනයථ පිළිගැනීම හෙවත් ප්‍රතිග්‍රහණය හා ඒ ඒ පාර්ශවයන්ට නෛතික බැඳීමක් ඇති කර ගැනීමට අයිතිය සහ මූලිකාංග ඉටුවිය යුතුය. (ල. 2)

ආ) * ජීවිත රක්ෂණ ඔප්පුව කල්පිරෙන තෙක් ජීවත් වුවහොත් රක්ෂණ ඔප්පුවේ වටිනාකම හා ප්‍රසාද දීමනා වැනි ප්‍රතිලාභ ලබාගත හැකිය.

* රක්ෂිතයා ලබාගෙන ඇති අතිරේඛ ආවරණ අනුව ලෙඩරෝග, ශල්‍යකර්ම සඳහා රෝහල් ගාස්තු ද ලබාගත හැකිය. (ල. 2)

v. අ) * සාමාජීය වශයෙන් අදහස් හා පණිවිඩ හුවමාරු කර ගැනීම සඳහා

* ජාත්‍යන්තර වශයෙන් සිදුවන සිදුවීම් පිළිබඳව ක්ෂණිකව දැන ගැනීම සඳහා
* අධ්‍යාපනික කටයුතු සඳහා තොරතුරු ලබා ගැනීම
* තාක්ෂණයේ දියුණුවක් සමග ඇති වන නව ප්‍රවනතා දැන ගැනීම සඳහා
* දේශීය හා විදේශීය වශයෙන් සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීම සඳහා (කරුණු 1 කට ල. 2)

ආ) නිල සංවිධාන ව්‍යුහයට බාහිරින් නිල වශයෙන් නොපිළිගන්නා, විනිවිද භාවයක් නොමැතිව තොරතුරු ගලායාම මගින් සිදුවන සන්නිවේදනය අවිධිමත් සන්නිවේදනයයි. (ල. 2)

04. i. අ) ප්‍රවාහනය කරන භාණ්ඩ හෝ මගින් ආරක්ෂා කිරීම ගමනාන්තය දක්වාම ගෙන යාමට හැකි විය යුතුය. (ල. 1)

උදා : * ඇපල් මිදි වැනි පලතුරු ආනයන අපනයන කර්යයේ දී ශුවන් යානා යොදා ගැනීම

* රෝගීන් ප්‍රවාහනය සඳහා ගිලන් රථ යොදා ගැනීම (උදාහරණ 1)

ආ) * දුම්රිය මාර්ග දිවයින පුරා ව්‍යාපතව නොතිබීම

* අවශ්‍ය ඕනෑම අවස්ථාවක දී සේවය ලබාගත නොහැකි වීම
* ගමනාන්තය දක්වාම යොදා ගෙන නොහැකි නිසා වෙනත් ප්‍රවාහන ක්‍රම ද යොදා ගැනීමට සිදුවීම
* විදුලි සංඥාදැනුම හිමිවේ, දුම්රිය මාර්ග අබලන් වීම ආදිය නිසා ප්‍රමාදවත් සිදු වීම (උදා, 2ට ල. 2)

ii. අ) * දොරවල්වල පිහිටීම * වර්ග ප්‍රමාණය

* සිවිලිමේ උස * ද්‍රව්‍ය ඇසිරීමේ පිළිවෙත්
* ගොඩනැගිල්ලේ සැලැස්ම (ල. 2)

ආ) සමබර වූ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධතිය (ල. 1)

එනම් අමු ද්‍රව්‍ය හෝ නිෂ්පාදිත ආයතන තෙක් ප්‍රවාහනය හා නිෂ්පාදනයෙන් පසු පාරිභෝගිකයා දක්වා ප්‍රවාහනය සමාන පද්ධතීන්ය. (ල. 1)

iii. අ) ගැනුම්කරුවෙකු හා විකුණුම්කරුවෙකු අතර කිසියම් ප්‍රතිෂ්ඨාවකට යටත්ව භාණ්ඩ හා සේවාවල අයිතිය හුවමාරු වීමේ ක්‍රියාවලිය වෙළඳාම ලෙස අර්ථ දැක්විය හැකිය. (ල. 1)

ආ) නිෂ්පාදිතයා පරිභෝගිකාය

ඉහත බෙදාහැරීමේ මාර්ගයේ දී සිල්ලර වෙළෙන්දෙකු දැකිය නොහැකිය. (ල. 1)

අවසාන පාරිභෝගිකයාට භාණ්ඩ විකිණීම සිල්ලර වෙළඳාම නිසා කුමන පාර්ශවයන් විසින් අවසන් පාරිභෝගිකයාට භාණ්ඩ අලවි කළ ද එය සිල්ලර වෙළඳාමත් ලෙස අර්ථකථනය කළ හැකිය. (ල. 1)

iv. අ) * එවැනි නිෂ්පාදිත පිළිබඳව විශාල තොරතුරු ප්‍රමාණයක් ඔවුන් සතු වීම

* එම නිෂ්පාදිත පිළිබඳව විශේෂඥ දැනුමක් පැවතීම
* ගැනුම්කරුවන් විශාල සංඛ්‍යාවක් පිළිබඳව තොරතුරු පැවතීම

(කරුණු 2 ක් සහිත පැහැදිලි කිරීමකට ල. 2)

ආ) * විවිධ නිෂ්පාදකයින් නිපදවන භාණ්ඩ හා සේවා ලබාගෙන අවශ්‍ය වේලාවට පහසු ස්ථානයක දී පාරිභෝගිකයාට ලබා දීමට කටයුතු කිරීම

* නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීමට පහසු වීම
* වෙළඳපල තොරතුරු අදාළ පාර්ශවයන්ට පහසුවෙන් ලබාගත හැකි වීම
* හුවමාරු ක්‍රියාවලිය සරල වීම (වාසි 2 කට ල. 2)

v. අ) * අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම

* ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම
* දැඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් මහජනතාවගේ වියදම් කිරීමේ හැකියාව සීමා වීම

(කරුණු 2 කට ල. 2)

ආ) * ණයවර ලිපි විවෘත කිරීම * බැංකු අණකර

* විද්‍යුත් ගෙවීම් ක්‍රම * විද්‍යුත් ගෙවීම් සේවා ආයතන හරහා ගෙවීම (කරුණු 4 ට ල. 4)

05. i. අ) 1. සේවකයන් හා කළමනාකරුවන් අතර මනා සම්බන්ධතාවය පවතින බව
2. කළමනාකරුවන් සේවක අදහස් හා යෝජනාවලට සවන් දෙන බව
3. ආයතනයේ කටයුතුවලට විධිමත් සන්නිවේදනයට අමතරව අවිධිමත් සන්නිවේදනය ද ප්‍රයෝජනයට ගන්නා බව (ල. 2)

ආ) 1. සේවක දුක්ගැනවිලි 2. වගවීම සම්බන්ධ කරුණු
3. උපදෙස් පැතීම් (ල. 2)

ii. අ) ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලිය
ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලියේ දී නායකයා විසින් අනුගාමකයින්ගේ අදහස් සැලකිල්ලට ගනු ලබයි. මෙම ආයතනයේ ද සේවක අදහස් එලෙස සලකා බලයි. (ල. 2)

ආ) 1. උසස් වීම් ලබා දීම 2. රැකියා සුරක්ෂිත බව ඇති කිරීම
3. යෝග්‍ය වැඩ පරිසරයක් ඇති කිරීම 4. සේවකයින්ව ඇගැයීමට ලක් කිරීම (ල. 2)

iii. 1. හැකියාව හා ධාරිතාවය ඉක්මවා සැලසුම් සැකසීම
2. ප්‍රමාණවත් හා නිවැරදි තොරතුරු නොලැබීම
3. කළමනාකරුවන්ගේ උනන්දුව හා කැපවීම ප්‍රමාණවත් නොවීම
4. ආයතනයේ සෑම මට්ටමකට සහයෝගය නියමිත පරිදි නොලැබීම
5. කළමනාකරුවන් අතර මනා සම්බන්ධීකරණයක් නොමැති වීම (ල. 4)

iv. නිෂ්පාදන ක්‍රියාවලිය තුළ යෙදවුම් (සම්පත්) නිමැවුම් බවට පරිවර්තනය කිරීමට අදාළ ව සිදුකරනුප ලබන සියලු කටයුතු ''මෙහෙයුම් කටයුතු'' ලෙස හැඳින්වේ. සංවිධානයක අපේක්ෂිත අරමුණු හා පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා එම සංවිධානය මෙහෙයුම් කටයුතු සැලසුම් කිරීම, සංවිධානය මෙහෙයවීම හා පාලනයට අදාළ කළමනාකරණ ක්‍රියාවලිය ''මෙහෙයුම් කළමනාකරණ'' හැඳින්වේ. (ල. 4)

v. <u>තොග පාලන ක්‍රම</u>
1. ද්විත්ව භාජන ක්‍රමය 2. තොග වාර්තා පවත්වාගෙන යාම
3. තොග මට්ටම් ක්‍රමය 4. ABC විශ්ලේෂණ ක්‍රමය
5. Jit ක්‍රමය (ල. 1/2X4 = ල.2)

<u>ගුණත්ව පාලන ක්‍රම</u>
1. ගුණත්ව පාලන අංශයක් පවත්වා ගෙන යාම 2. ගුණත්ව ප්‍රමිති භාවිතා කිරීම
3. තත්ව ආරක්ෂණ ක්‍රම 4. තත්ව පාලන ක්‍රම
5. සංඛ්‍යානමය ක්‍රියාවලි පාලනය 6. ශුන්‍ය දෝෂ ක්‍රමය (ල. 1/2X4 = ල.2)

06. i. 1. 100X6 =1600 (ඒකක) (ල. 1)

2. 1600 - (70 X 13)
1600 - 9610
=690 (ඒකක) (ල. 1)

3. 1600 - (40 X 10)
1600 - 400 + 2000
3200 (ඒකක) (ල. 1)

4. $\frac{690+3200}{2}=\frac{3890}{2}=1945$ (ඒකක) (ල. 1)

ii. අ) 1. නිෂ්පාදිතයකට නිශ්චිත ආයු කාලයක් ඇති බව
2. භාණ්ඩයක ජීවන චක්‍රයෙහි විවිධ අදියරවල දී විකුණුම් හා ලාභය වෙනස් වන බව
3. නිෂ්පාදිතයක් අලෙවිකරුවාට වෙනස් අභියෝග ගෙන දෙන විවිධ අදියර කිහිපයක් පසු කරන බව
4. නිෂ්පාදිතයක් ගමන් කරන එක් එක් අදියරේ අලෙවිකරුවා විසින් ඊට ගැලපෙන අලෙවිකරණ අරමුණු හා උපාය මාර්ග අනුගමනය කරන බව (කරුණු 4 ට ල. 2)

ආ) 1. සංවර්ධන අදියර
භාණ්ඩයක සංවර්ධන අදියර ආරම්භ වන්නේ තම භාණ්ඩ පිළිබඳ අදහස් උත්පාදනය වීමත් සමඟමය. මෙම අදියරේ දී විකුණුම් සිදු නොවන අතර පර්යේෂණ හා සංවර්ධන වියදම් දැරීම සිදුවේ.
2. පිරිහීමේ අදියර
පිරිහීමේ අදියරේ දී විකුණුම් සීඝ්‍රයෙන් පහළ බසියි. එමෙන් ලාභය ද සීඝ්‍රයෙන් පහළ බැසීමක සිදුවන අතර අවසාන වශයෙන් ලාභ ලබන තත්වයකට පත්වේ.

<table>
<tr><td rowspan="2">රෙදි සෝදන සබන්</td><td colspan="4">දෙහි සුවඳ</td><td rowspan="2">රෝස මල් සුවඳ</td><td rowspan="2">පිච්ච මල් සුවඳ</td></tr>
<tr><td>50g</td><td>75g</td><td>110g</td><td>125g</td></tr>
<tr><td>ඇඟේ ගාන සබන්</td><td colspan="2">පිච්ච මල් සුවඳ</td><td colspan="2">අරලිය මල් සුවඳ</td><td>සපුමල් සුවඳ</td><td>නාමල් සුවඳ</td></tr>
<tr><td>හඳුන්කූරු</td><td colspan="2">නාමල් සුවඳ</td><td colspan="3">සපුමල් සුවඳ</td><td>පිච්ච මල් සුවඳ</td></tr>
</table>

මෙම ආයතනයේ නිෂ්පාදිත විශ්‍රයේ

පළල - 3 කි එනම් රෙදි සෝදන සබන්, ඇගේ ගාන සබන් සහ

දිග - 10 කි. එනම් රෙදි සෝදන සබන් වර්ග 3යි ඇගේ ගාන සබන් වර්ග 4 යි හඳුන්කුරු 3 යි.

ගැඹුර - රෙදි සෝදන සබන්වල දෙහි සුවඳ සබන් ප්‍රමාණ තුනකින් නිෂ්පාදනය කරන බැවින් එහි ගැඹුර තුනකි.

මෙම ආයතනයේ නිෂ්පාදිත වර්ග තුනෙන් රෙදි සෝදන සහ ඇගේ ගාන සබන් පිරිසිදු කිරීම සඳහා භාවිතයට ගැනීම සිදුවන නිසා ඉන් අතර සංගතභාවයක් ඇත. (ල. 4)

iv. 1. සම්බන්ධතා අලෙවිකරණය 2. සමෝධානිත අලෙවිකරණය
3. අභ්‍යන්තර අලෙවිකරණය 4. කාර්යසාධන අලෙවිකරණය

සම්බන්ධතා අලෙවිකරණය

ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් අතිවන්නේ සියලු ම පාර්ශවයන්ට ම ප්‍රතිඵලදායි සම්භාණ්ඩතා ගොඩනැගීම මෙහි අරමුණයි. මෙහි ප්‍රතිඵලය වන්නේ ව්‍යාපාරයක් එහි සියලු ම ඇල්මැති පාර්ශව අතර ලාභදායී සම්භාණ්ඩතා සහිත අලෙවිකරණ ජාලයක් නිර්මාණය වීමයි.

සමෝධානිත අලෙවිකරණය

අලෙවිකරණ මිශ්‍රයේ සියලු ම විචල්‍යයන් (4PS) ඉල්ලක්ක ගනුදෙනුකරුවන් තෘප්තිමත් කිරීම අරමුණු කර ගෙන ක්‍රියාත්මක විය යුතු බව මෙහි අදහසයි. නැතහොත් ආයතනයේ සියලු ම කළමණාකරුවන්ගේ හා සේවකයින්ගේ කාර්යයන් අලෙවිකරණ කාර්ය හා සමායෝජනය විය යුතුය.

අභ්‍යන්තර අලෙවිකරණය

ව්‍යාපාර ආයතනයේ සේවයේ නියුක්ත සියලු ම සේවකයින්, එනම් ඉහළ කළමනාකරණයේ සිට පහළ ම සේවකයා තෙක් ගනුදෙනුකරුට හොඳ සේවාවක් ලබා දීමට සහයෝගයෙන් හා සක්‍රීයව එකතු වීම අභ්‍යන්තර අලෙවිකරණයයි. එනම් ආයතනයේ සියලු ම දෙනා යෝග්‍යම මූලධර්ම අනුගමනය කරන බව තහවුරු වේ.

කාර්ය සාධන අලෙවිකරණය

අලෙවිකරණ වැඩසටහන් හා ක්‍රියාමාර්ග සැකසීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී සමාජ වගකීම් හා ආචාරධර්ම හා පරිසරය පිළිබඳව අවදානය යොමු කරමින් කටයුතු කළ යුතු බව මින් අදහස් කරයි. එනම් ව්‍යාපාරික ඉලක්ක හා පාරිභෝගික තෘප්තිය කෙරෙහි අවදානය යොමු කරන අතර ම සමාජය කෙරෙහි මෙන් ම පරිසරය කෙරෙහි ද එකසේ අවදානය යොමු කළ යුතු බව මින් අවදානය කරයි.

v. අ) 1. කොටස් විකිණීමෙන් ලැබෙන ප්‍රාග්ධන ලාභ, බදුවලින් නිදහස් වීම
2. රජයේ සුරැකුම්පත්වල කරනු ලබන ආයෝජනයේ අවදානම ඉතා අඩු වට්ටමක පැවතීම හා ඉතා ඉහළ ද්‍රවශීලතාවයෙන් යුක්ත වීම.
3. රජයේ සුරැකුම්පත් මිල දී ගත් අයට ණය ලබා ගැනීමේ දී එය සුරැකුම්පත් ලෙස භාවිත කළ හැකි වීම.
4. සමාගමක සාමාන්‍ය කොටස් හිමියන්ට ඡන්ද බලය හිමි වීම හා අධ්‍යක්ෂවරයා ලෙස පත් විය හැකි වීම.
5. අවශ්‍ය විටක සුරැකුම්පත් කොටස් වෙළෙඳපළේ අලෙවි කළ හැකි එනම් ඉක්මනින් මුදල් බවට පත් කිරීමට හැකි වීම හා ඉහළ ද්‍රවශීලතාවයකින් යුක්ත වීම. (කරුණු 4 කට ල. 2)

ආ) සීමිත ප්‍රකාශිත ප්‍රාග්ධනයක් සහතිව ආරම්භ වූ සමාගම් ලැයිස්තුගත කිරීම වෙන් වූ පුවරුව වේගවත් හැඳින්වේ.

අවශ්‍යතා

1. සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය මිලියන 10 ට නොඅඩු වීම
2. සමාගමේ ක්‍රියාකාරී කාලය සීමාව අවම වශයෙන් වසරක් වීම
3. ව්‍යාපාරයේ ශුද්ධ වත්කම් ලැයිස්තුගත කිරීමට ඉල්ලුම් කළ දිනට වසරක විගණනය කරන ලද මූල්‍ය වාර්තා මගින් තහවුරු කළ යුතුය.
4. නිකුත් කරන ලද කොටස් ප්‍රමාණයෙන් අවම වශයෙන් 10% ට නො අඩු ප්‍රමාණයක් මහජනයා සතු වීම. (ල. 2)

07. i. අ) 1. වාණිජ පත්‍රිකා වෙළෙඳපොළ 2. දේශීය විදේශීය විනිමය වෙළෙඳ පොළ
3. භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ 4. අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳපොළ (ල. 2)

ආ) 1. මුදල් කළමනාකරණය පිළිබඳ තීරණ 2. ණයගැතියන් පිළිබඳ තීරණ
3. වෙළෙඳ තොග පිළිබඳ තීරණ
4. වෙනත් කෙටිකාලීන ආයෝජන පිළිබඳ තීරණ (නිදසුන් ප්‍රමාණවත්) (ල. 2)

ii. නිශ්චිත අනාගත කාලච්ඡේදයක් මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් ඇතුළත් කර සකස් කරනු ලබන ලේඛනය මුදල් අයවැය ලේඛනය ලෙස හඳුන්වයි. (ල. 1)

ව්‍යාපාරිකයින්ට ලැබෙන ප්‍රයෝජන

1. අනාගතයේ මුදල් අතිරික්තයක් වේ නම්, එය කල්තබා දැනගෙන ගත හැකි වීමෙන් එම අතිරික්ත මුදල් ඵලදායී ව ආයෝජනය කළ හැකි වීම.
2. අනාගතයේ මුදල් ඌණතාවයක් ඇති වේ නම්, එය ද කල් තබා දැනගෙන එයට මුහුණ දීමට සූදානම් විය හැකි වීම.
3. සත්‍ය මුදල් ක්‍රියාකාරීත්වය හා සැසඳීම මගින් මුදල් පිළිබඳ සැලසුම්කරණය හා පාලනය පහසු වීම.
4. ව්‍යාපාරික ණය ලබා ගැනීම ව්‍යාපාරයේ අනාගත මූල්‍ය තත්වය තහවුරු කිරීම සඳහා ඉවහල් වීම. (ල. 3)

iii. අ)
- සාධාරණ වැටුපක් ගෙවීම
- වෘත්තිය ආරක්ෂාව ලබා දීම
- නිසි පරිදි උසස් වීම් සිදු කිරීම
- හිතකර වැඩ පරිසරයක් ඇති කිරීම
- යහපත් ශ්‍රමික සම්බන්ධතා පවත්වා ගැනීම
- සුබ සාධන කටයුතු (ල.1/2X4=2)

ආ)
- ආයතනික ඵලදායිත්වය පහළ යාම
- සේවක පිරිවැටුම ඉහළ යාම
- සේවක ප්‍රවාසිතාවය ඉහළ යාම
- කාර්මික සාමය බිඳ වැටීම
- දුක්ගැනවිලි ඉහළ යාම
- සම්පත් නාස්තිය (ල.1/2X4=2)

iv. අ)
1. ශ්‍රම පිරිවැටුම
2. සේවක ප්‍රවාසිතාවය
3. ශ්‍රම ඵලදායිතාවය
4. ශ්‍රමික සම්බන්ධතා
5. මානව සම්පත් ගිණුම්කරණය (ල.1/2X4=7)

ආ)
1. සේවා වගකීම් නිසි පරිදි ඉටු කිරීම
2. රැකියා සුරක්ෂිතතාවය තහවුරු කිරීම
3. සේවකයා සතුටු වන පරිදි යහපත් වැඩ පරිසරයක් ඇති කිරීම
4. සේවකයාගේ සාධාරණ ඉල්ලීම්වලට ඇහුම්කම් දීම (ල.1/2X4=2)

v. අ)
A රැකියා ඇබෑර්තු හඳුනා ගැනීම
C ආකර්ෂණයට අදාළ සාධක සලකා බැලීම
E අකාර්ශණ ක්‍රමය තෝරා ගැනීම
G අයදුම්පත් ඇගයීම (ල.1/2X4=2)

ආ) එකඟ නොවේ. (1/2)
- නව දැනුම හා කුසලතා සංවිධානයට ගලා නොඒම
- සේවකයින් අතර අනවශ්‍ය තරඟයක් ඇති වීම
- පුහුණුව සඳහා ඉහළ පිරිවැයක් දැරිය යුතු වීම
- යෝග්‍යතම පුද්ගලයින් බඳවාගත නොහැකි වීම (ල.1/2X3=11/2)

08. i. අ)
- තොරතුරුවල නිරවද්‍යතාවය ඉහළ යාම
- වේගවත්ව තොරතුරු ලබාගතහැකි වීම
- යාවත්කාලින තොරතුරු ලබාගත හැකි වීම
- නම්‍යශීලි බව
- ව්‍යාපාරයේ සෙසු කාර්යන් අතර ද පහසු වීම
- ආයතනයේ සමස්ත ගුණාත්මක බව ඉහළ යාම (ල.1/2X4=2)

ආ) මෘදුකාංග

පද්ධති මෘදුකාංග (System Software)
පරිගණක පද්ධතිය තුළ සියලුම උපකරණ කොටස් හැසිරවීම සඳහා යොදාගන්නා මෘදුකාංගයි
උදා- Windows, Apple mac, Linux, android

භාවිත මෘදුකාංග (Application Software)
පරිගණක පද්ධතිය දත්ත සැකසීමේ ක්‍රියාවලින් පාලනය සඳහා උපයෝගී කර ගන්නා මෘදුකාංගයි
උදා- MS Word, Page Maker, Spreadsheet

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

ii. අ) - බිඳ වැටීම්වල දී මුළු ක්‍රියාකාරීත්වයට ම බලපෑම
- නව තාක්ෂණය හඳුන්වා දීමේ දී අධික පිරිවැයක් දැරීමට සිදුවීම
- සේවක පුහුණු අවශ්‍යතා වෙනුවෙන් පිරිවැය
- යාන්ත්‍රිකරණය වූ කාර්යාලීය පරිසරයක් ඇති වීම
- තොරතුරු තාක්ෂණය ඉක්මනින් යල් පැනීම නිසා යාවත්කාලින කිරීමේ අභියෝගය
- පැරණි පද්ධති ඉවත් කිරීමේ දුෂ්කරතා
- තොරතුරුවල රහස්‍යභාවය පිළිබඳ ගැටළු ඇති වීම (ල. 02)

ආ) AI යනු යන්ත්‍ර මගින් / පරිගණක පද්ධති මගින් මිනිස් බුද්ධි ක්‍රියාවලින් අනුකරණය කිරීමයි. මෙම ක්‍රියාවලියට ඉගනීම, තර්ක කිරීම, ස්වයං නිවැරදි කිරීම ආදි හැකියාවන් ඇතුළත් වේ.

උදා : දත්ත විශ්ලේෂණය, ආලෝකරණ කටයුතු, නිෂ්පාදිත නිර්මාණ කරණය හෝ වෙනත් සුදුසු) (ල. 2)

iii.

තොරතුරු පද්ධති (ල. 02)

- උපක්‍රමික මට්ටමේ තොරතුරු පද්ධති → ESS
- කළමනාකරණ මට්ටමේ තොරතුරු පද්ධති → MISS, DSS
- දැනුම් මට්ටමේ තොරතුරු පද්ධති → KWS, OAS
- මෙහෙයුම් මට්ටමේ තොරතුරු පද්ධති → TPS

හෝ

(කුමන හෝ ආකාරයකට අන්තර් සම්බන්ධතා දක්වා තිබෙන විට 1X4=4)

iv.

| <u>මූල්‍ය මිනුම් දඬු</u> | <u>මූල්‍ය නොවන මිනුම් දඬු</u> |
|---|---|
| - ප්‍රමාණවත් ලාභය | - තෘප්තිමත් සේවකයින් |
| - ව්‍යාපාරයේ මුදල් අතිරික්තය | - මනා කළමනාකාරීත්වය |
| - සංචිත පැවතීම | - තෘප්තිමත් ගනුදෙනුකරුවන් |
| - ඉහළ වැටුප් ගෙවීම | - නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව සිදුවීම |
| - ඉහළ ආදායම් | |
| - ලාභ සමච්ඡේද ලක්ෂ්‍ය | |
| (ල. 1/2X4=2) | (1/2X4=2) |

v. අ) - පවත්නා තරඟකාරීත්වය
- තරඟකරුවන් හා ඔවුන්ගේ ශක්තීන්
- තරඟකාරීත්වයට මුහුණ දීමට අදාළ ව්‍යාපාරික සතු ශක්තීන් හා දුර්වලතා
- වෙළඳපලට පිවිසීමට ඇති බාධා

වැනි කරුණු විශ්ලේෂණය කර දැක්වීම තරඟකාරීත්ව විශ්ලේෂණයයි. (ල. 2)

ආ) - අරමුදල් සම්පාදනයේ දී දුෂ්කරතා මතු වීම
- ආයෝජකයින් ආකර්ෂණය අපහසු වීම
- සේවකයින් සඳහා නිසි මග පෙන්වීමක් නොමැති වීම
- කළමනාකරණ උදෙසා මග පෙන්වන නිශ්චිත අනාගත වැඩසටහන් නොමැති වීම

PAST PAPERS WIKI



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න